# මගේ ලෝකය

## ඇසෙන දැනෙන දේ..
## හිතට වැදෙන දේ..

*Accept no one's definition of your life;*
*define yourself.*
**Harvey Fierstein**



ජගත් ජේ එදිරිසිංහ

සිහින් සංගීත නාදයක් නිකුත් වෙයි. තිරය ක්‍රමයෙන් විවර වෙයි. වේදිකාව මත නෙළුම් විලකි. පෙසින් රුස්ස ගසින් සැදි මහා වනාන්තරයකි. විශාල නෙලුම් පොහොට්ටු දෙකක් වේදිකාවේ මැද කොටසට වන්නට පිපෙන්නට බලා සිටියි. පසුබිමෙන් ඈත කඳුයාය හා නිල් අහසයි. අහස හරහා සුදු පැහැති වළාකුළු පාව යමින් තිබෙයි.

ඩෝං...

ප්‍රේක්ෂකයා බලාපොරොත්තු නොවූ මොහොතක රතිඥද්ඥදාවක් පිපිරෙන හඬක් සමගින් නෙලුම් මල් දෙක පිපෙයි. එතුළින් නැගිට එන නාට්‍යාංගනාවෝ දෙදෙනෙක් පසුබිම් සංගීතයට අනුව අපූරු රංගනයක් ඉදිරිපත් කරති. ඔවුන් රංගනය අවසන් කරන්නේ අහස් කුස දෙසට වදිමිනි.

ඩෝං...

නැවතත් පිරුම් හඬක්. ඒ සමගින් නිල් අහස මත තරුවක් පහළ වෙයි. තරුව මැද රන් අබරණින් සැරසුණ දේවතාවෙකි. වැඳගත් දෑතින් ප්‍රේක්ෂකයන් දෙස බලා සිටින ඔහු ආරම්භක ගීය ගායනා කිරීම අරඹයි.

මේ මා ලිව්වේ ටවර් හෝල් යුගයේ විස්මකර්ම ගුරුන්නාන්සේ නමින් හැඳින්වුණ ඩී ජේ ඩබ්ලිව් ගුණතිලක ගුරුන්නාන්සේ ගේ ශ්‍රී සංඝබෝධි නූර්තියේ ආරම්භක ජවනිකාවයි.

මා කුඩා කල - හැත්තෑව දශකයේ මුල් භාගයේ දී - ඩී ජේ ඩබ්ලිව් ගුණතිලක ගුරුන්නාන්සේ ගේ පුත්‍රයා වන කලාභූෂණ ලයනල් ගුණතිලක විසින් ප්‍රතිනිර්මාණය කරන ලද මේ විස්මිත නූර්තිය නැරඹීමේ භාග්‍යය ලද්දෙමි. අප වඩාත් ආසා කළේ ප්‍රේක්ෂකයකු ලෙස අසුනක වාඩි වී නාට්‍යය නරඹන්නට නොවේ. වේදිකාව මත සිදුවන විස්මිත දේ කෙසේ සිදුවන්නේ දැයි වේදිකාවේ පසුපසට වී බලා සිටින්න ය.

වේදිකාව මත සිදුවන මේ විස්මිත ක්‍රියා ඇස්බැන්දුම් බව අපි දැන සිටි නමුත් මේ ඇස්බැන්දුම් කෙසේ කරන්නේ දැයි දැක බලා ගැනීමේ මහා කුතුහලයකින් අපි පෙළුණෙමු.

වේදිකාවේ නෙළුම් මල් තුළ නාට්‍යාංගනාවන් සඟවා තැබීම
අහසේ තරුවක් පහළ වීම
මේ තරුව තුළ දේවියකු ගේ වෙස් ගත් මිනිසකු රැඳවීම
අහසේ වළාකුළු පාව යාම
විදුලි කෙටීම
වේදිකාව මත වැස්සක් වැස්සවීම
පිහියෙන් ඇන රජෙකු මරා දැමීම
සිරසඟබෝ රජතුමා හිස ගලවා දීම
මහල්ලා විසින් ගොඩාභය රජු වෙත රැගෙන එනු ලබන හිස මේසයක් මත තැබූ විට කතා කිරීම
ඒ හිස අහසට නැග ප්‍රාතිහාර්ය පෑම

මේ ආදී බොහෝ විස්මිත ඇස් බැන්දුම් වලින් ප්‍රේක්ෂකයන් මවිත නොවූවා නම් එය මහ ම පුදුමයකි.



දොන් විලියම් විජේසිංහ ගුණතිලක නාඩගම් ගුරුතුමා හා එතුමාගේ බිරිඳ

(වේදිකාවේ අහසේ පෑයූ තරුවේ දේවතාවකු ලෙස සැරසී පිළිගැනීමේ ගීය ගායනා කළේ ලයනල් මාමාගේ පුතා වන මා හා සම වයසේ සිටි ශාන්ත අයියා ය. ප්‍රේක්ෂකයාට තරුව තුළින් උඩුකය පෙනෙන සේ ඔහු ඉතා උස ඉනිමගක නැග සිටියේ ය. ඒ ඉනිමග නොසෙල්වෙන සේ අල්ලාගෙන සිටි ලොකු මිනිසුන් අතරට වී යාන්තම් කොණකින් ඉනිමග අල්ලාගෙන සිටීම වරය ලැබීම එදා මට මහත් සතුටක් ගෙන දුන්නේ ය)

ශ්‍රී ලාංකේය වේදිකාවේ නූර්ති පිලිබඳ කතා බහ කෙරෙන විට සෑම විටම අමතක කර දමා ඇති ගුණතිලක පරම්පරාව පිලිබඳ විස්තරයක් සහිත පැරණි පොත් දෙකක් කියවීමේ අවස්ථාව මට හිමි විය. ඇල් ඩී ඒ රත්නායක නම් මහතකු විසින් 1947 දී ලියන ලද මේ පොත් දෙක ''සංගීත ඉතිහාසය'' හා ''ටවර් හෝල් නාට්‍ය ඉතිහාසය'' නම් වෙයි.

සිංහල නූර්ති ඉතිහාසයේ නම රැන්දූ ගුණතිලක පරම්පරාවේ නාට්‍ය ඉතිහාසය ආරම්භ වන්නේ දොන් විලියම් විජේසිංහ ගුණතිලක මහතා ගෙනි. අලුත්ගම මාලවනකන්ද වත්තේ වලව්වේ දොන් පිලිප් විජේසිංහ ගුණතිලක මුහන්දිරම් තුමා ගේ පුතා ලෙස 1847 දී උපත ලැබුවේ ය. දොන් විලියම් විජේසිංහ ගුණතිලක මහතා ප්‍රසිද්ධ කිවි වරයකු වූයේ ය. කර්ණාට සංගීතයට විශේෂ ඇල්මක් දැක් වූ ඔහු 1890 දී ''කේසර සිංහයා හෙවත් පතිසුන්දර නාඩගම'' රචනා කර කොළඹ ආදුරුප්පු වීදියේ ගෑස් ආලෝකයෙන් නිමකළ රඟමඬලේ දී රඟ දැක්වූයේ ය. නැරඹූ ප්‍රභූ වරුන් අතර ඉමහත් ප්‍රසාදය දිනාගත් මේ නාඩගම ඉන් පසු දිවයිනේ බොහෝ පළාත් වල ප්‍රදර්ශනය කරන්නට ඔහුට සිදුවිය. එතුමා 1907 දී ජන්මාන්තර ගත විය.

ඔහුගේ පුතා ඩී ජේ ඩබ්ලිව් ගුණතිලක නම් විය. උපන්නේ ක්‍රිව 1872 දී ය. පසු කළෙක විස්මකර්ම ගුරුන්නාන්සේ ලෙස ප්‍රකට වූ යේ ඔහු ය.

මතු සම්බන්ධයි

spot on
MOBILE MECHANIC
SERVICE CENTRE

RWC
Tune-up/Service
Starter Motors/Alternators
Batteries
Major & Minor Repairs
Pre-Purchase Vehicle Inspection
Brakes/Clutches
Auto Trans/Power Steering
CV Joints/Drive Shafts
Breakdown Service
All Makes & Models








ඔබේ වාහනයේ
සියලු අලුත්වැඩියාවන් සඳහා
විශ්වාසවන්ත සේවාව

WE PROVIDE
FULL MECHANICAL &
BREAKDOWN SERVICES

PROFESSIONAL
FAST EFFICIENT &
AFFORDABLE SERVICE

Ubaya Dewapriya (Dew)

14/50 Camp Road Broadmeadows Vic 3047
Ph: 9359 4848 Mobile: 0421 285 181